**පූනාකරෙයි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 25 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පූනාකරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශයය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 23 දින ඉදිරිපත් කර තිබූ අතර වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීතීන්/ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීම යන කාරණාව ඉදිරි වර්ෂයේදී සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ එකතු කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**--------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඒවා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කර තිබිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි වර්ෂයේදී හෙළිදරව් කරනු ලැබේ. |

(ඇ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මස්කඩ හිඟ බදු ආදායම් රු.52,589 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එම නිසා ආදායම් මෙම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2019 වර්ෂ අවසාන ගිණුම් වාර්තාවල මෙම කරුණ පිළිබඳව සැලකිල්ල යොමු කර නිරවුල් කරනු ලැබේ. |
| (ii) | සුළු ණය හිමියන් ගිණුමේ පැවති කර්මාන්ත දෙකක රු.800,000 ක ගෙවීම්, 2019 මාර්තු 31 දක්වා අදාළ කර්මාන්තයන් අවසන් කර ගෙවීම් සිදුකර නොතිබුණි. | කර්මාන්තයන් ගිවිසුම් කාල පරිච්ඡේද තුළම අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අදාළ වර්ෂයේදීම කර්මාන්තයන් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 891(1) | ඇප මුදල් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) අනුව කටයුතු කළ යුතුවය. | ඇප මුදල් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.944,090 ක් වූ තැන්පතු 46 ක් එකතුව සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තැන්පතු 11 ක් ආපසු ගෙවා ඇත. අනෙකුත් තැන්පතු ගෙවීම සඳහා කටයුතු කර ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 138 | වියදම් සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන් නොමැතිව රු.39,484 ක් වටිනා ගෙවීම් 08 ක් සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැන් සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන් ලබාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 371 මඟින් සංශෝධිත 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛයේ 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම රු.100,000 ක් දක්වා ලබාදිය හැකි බව සඳහන් කර තිබුණත් රු.110,445 ක් ලබා දී තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. | වාහන රක්ෂණය කිරීම සඳහා රු.110,445 ක අත්තිකාරම් ලබා දී තිබුණි. මෙම අත්තිකාරම් නිරවුල් කර ඇත. |
| (ආ) | පළාත් මූල්‍ය රීති අංක 163.3 | ලබා දී තිබූ අත්තිකාරම් රු.1,332,276 ක් 2018 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කර නොතිබුණි. | පළාත් මූල්‍ය රීතිවලට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී මෙවැනි දෝෂ සිදුනොවන ආකාරයෙන් කටයුතු යොදා ඇත. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස් (ආදායම්) ගේ 2016 මැයි 25 දිනැති අංක. 04/2016 දරන චක්‍රලේඛය | රජයේ හිඟ බදු, හිඟ මුදල් අයකිරීම් පිළිබඳ මාසික වාර්තා ප්‍රා. ස. 07 ගිණුම් වාර්තා මාසිකව පිළියෙල කළ යුතු බවට සඳහන් කර තිබුණද, සභාව විසින් ප්‍රා.ස. 07 පිළියෙල කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේදී ප්‍රා. ස. 07 පිළියෙල කර නොතිබුණි. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කර ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.5,621,348 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.4,809,086 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

---------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ අවශ්‍යතා සඳහා සේවකයින්ට ලබා දී තිබූ අත්තිකාරම් 15 ක එකතුව රු.2,358,422 ක් මාස 02 සිට 64 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | අත්තිකාරම් අදාළ කාල පරිච්ඡේදය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අදාළ නිලධාරීන්ගෙන් ස්ථාවර තැන්පතු පොලී අනුපාතයට අනුව දඩ ගාස්තු අයකිරීමට කටයුතු කර ඇත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 212,550 | - | 197,570 | 3,850 | 27,000 | - | 38,400 | - |
| (ii) | කුලී | 2,531,460 | - | 2,591,008 | 951,617 | 3,915,045 | - | 2,530,644 | 723,580 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 409,120 | - | 701,286 | - | 690,450 | - | 800,952 | - |
| (iv) | වෙනත් ආදායම් | 7,075,140 | - | 8,988,534 | 7,087,696 | 6,626,000 | - | 7,625,735 | 5,000,357 |
| | | **10,228,270** | **-** | **12,478,398** | **8,043,163** | **11,258,495** | **-** | **10,995,731** | **5,723,937** |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂ අවසානයේ පැවති රු.951,617 ක් වූ කුලී හා බදු වර්ෂ 01 සිට වර්ෂ 07 ක් දක්වා අය කර නොගෙන හිඟ හිටව දක්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට ලේකම්වරයා විසින් කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් අයකිරීම සඳහා එකඟතා කමිටුවේ ක්‍රියාමාර්ග සඳහා යවා ඇත. |
| (ආ) | සභාව විසින් ආදායම් ලැයිස්තු ගත කර රැස්කිරීම සඳහා පසුගිය වර්ෂ 10 ක් තුළ යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් ලැයිස්තු ගත කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ආදායම් ලැයිස්තු ගත කර අයකිරීමට කටයුතු කර ඇත. |

### 2.3.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උසාවි දඩ මුදල් | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.4,553,917 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ මුදල් නියමිත කාලය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. | උසාවි දඩ මුදල් ඉල්ලීම් ලිපි යවා තිබූ නමුත්, එම ගාස්තු ලැබී නොතිබුණි. |

(ආ) මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.2,491,705 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | මුද්දර ගාස්තු නියමිත කාලය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. | මුද්දර ගාස්තු සඳහා ඉල්ලීම් ලිපි යවා තිබූ නමුත්, එම ගාස්තු ලැබී නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. |

**(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක වි.ලේ.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීම සඳහා සභාව විසින් අදාළ ඉලක්ක සකස් කරමින් පවතී. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 72 ක් ද තථ්‍ය සේවක සංඛ්‍යාව 41 ක් වශයෙන් ද පැවතුණු අතර පුරප්පාඩුව පැවති සේවක සංඛ්‍යා තනතුරු 31 ක පුරප්පාඩු පුරවා නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | ජ්‍යෙෂ්ඨ මට්ටම සහ ද්විතියික මට්ටම්වලට සේවකයන් 04 දෙනෙකු පුරවා ඇත. මෙයින් ද්විතියික මට්ටමට පුරවන ලද සේවකයෙකු අප සභාවට මුදාහැර නොතිබුණි. අනෙකුත් |

මට්ටම්වලට අදාල පුරප්පාඩු මෙම වර්ෂයේදී තීරණය කරනු ලැබේ.

**3.3 වත්කම් කළමනාකරණය**

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති ස්ථාවර වත්කම්වල එකතුව රු.136,570,183 ක් වුවත් සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ. | පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |

**(ආ) නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වාහන 11 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. මේවා භාවිතයට ගත හැකි අයුරින් අලුත්වැඩියාවන් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා කළ නොහැකි වාහන භාවිතා කළ හැකි පරිදි වෙනස් කිරීමට කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීමෙන් නිෂ්ක්‍රීයව පැවතුණි. ඉදිරි වර්ෂයේදී අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. බවුසර් රථ සහ ට්‍රේලර් වෙන්දේසියේ විකිණීමට අනුමැතිය සඳහා ලිපි යවා ඇත. |

**(ඇ) පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතය සඳහා සභාවට පරිත්‍යාග කර තිබූ වාහන 38 ක් මේ දක්වා සභාවට පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය මාරුකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | සභාවේ ඇති වාහන 38 න් වාහන 10 ක අයිතිය පවරා ගෙන ඇත. එක් වාහනයක් බදු පදනම මත තිබේ. වාහන 11 කට කිසිඳු ලිපිලේඛන නොමැත. වාහන 06 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර ඇත. |

**(ඇ)** **නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ මෝටර් ග්‍රේඩරය සහ රෝලරය භාවිතා කර කාර්යයන් සිදු කිරීම මඟින් ආදායම් උපයා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් භාවිතා කර ආදායම් ඉපැයීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | මෝටර් ග්‍රේඩරය භාවිතය සඳහා රියදුරු හිඟයක් පවතී. රෝලරය දැනට අක්‍රීය වී ඇත. අලුත්වැඩියා කර ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. |

**3.4** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පූනාකරෙයි මහජන පුස්තකාලයේ පොත් 168 ක ඌනතාවයක් පවතින බව සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් සිදු කළ අනාවරණයන්ට අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොත්වල හිඟය සම්බන්ධයෙන් නියමිත ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ දක්වා පොත් 29 ක් පාඨකයින්ගෙන් ආපසු ලැබී තිබුණි. |

**3.5** **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ ක්‍රියාත්මක කළ වීජි මාර්ග ප්‍රතිසංස්කරණය, පල්ලවරායන්කට්ටු සෝලෙයි පාසැල් මාර්ගය ප්‍රතිසංස්කරණය සහ ඩෝන්බොස්කෝ මාර්ගය ප්‍රතිසංස්කරණ කර්මාන්තයන් ගිවිසුමේ සඳහන් කාලයට වඩා මාස 06 ක් ප්‍රමාද වී අවසන් කිරීම නිසා පිළිවෙලින් රු.92,000 ක් රු.45,000 ක් සහ රු.78,015 ක් ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. | ICTAD ආයතනයේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරු විසින් කාර්යයන් අවසන් කිරීමේදී ද්‍රවශීලතා අලාභ අයකිරීමේ ක්‍රියා පටිපාටිය පවතී. ඉදිරි කාලයේදී සභා තීරණ මත ගිවිසුම් කොන්දේසිවල ද්‍රවශීලතා අලාභ සම්බන්ධයෙන් වූ වගන්ති ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. |

**4.** **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් රු.274,000 ක් පුහුණු පාඨමාලා සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවත්, අදාළ අරමුණු සඳහා භාවිතා නොකර ප්‍රතිපාදන මාරු කිරීම් මගින් වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කර තිබුණි. | ප්‍රතිපාදන වෙන් කළ අරමුණු සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | ආදායම් අඩු සභාවක් බැවින් අදාළ පරමාර්ථ සඳහා උපයෝජනය නොකර තිබූ අරමුදල් වෙනත් පරමාර්ථ සඳහා උපයෝජනය කර තිබුණි. |